කොවිඩ්-19 වසංගතය පැතිර යන ශීඝ්‍රතාවය හා සමානවම, කොවිඩ්-19 සම්බන්ධ වූ විවිධ සාවද්‍ය, විකෘති කළ, නොමඟ යවන සුළු තොරතුරු පැතිර යෑමද මේ වන විට වසංගතයක් බවට පත්ව තිබේ. විශේෂයෙන්ම සමාජ මාධ්‍ය සහ වට්ස්ඇප් වැනි සේවාවන් ඔස්සේ මෙවැනි වැරදි තොරතුරු පැතිර යයි. මේ නිසා, කොවිඩ්-19 සම්බන්ධයෙන් වාර්තාකරණයේදී හැකි උපරිම මට්ටමෙන් පිළිගත හැකි, විශ්වසනීය මූලාශ්‍ර ඔස්සේ කරුණු පිරික්සා බලා, කරුණු වල නිරවද්‍ය භාවය දෙවරක් නොව තෙවරක්ම සහතික කොටගෙන ඉදිරිපත් කිරීම මාධ්‍යයන්හි වගකීමද වෙයි.
කෙසේ වෙතත් එම වගකීම කඩවන තැන්ද බොහෝ දක්නට ලැබේ. "සත්‍ය වටහා ගන්නා ජනතාවක්" යන සිරස්තලයෙන් යුතුව ඉදිරිපත් වී ඇති මව්බිම (05/09) කතුවැකිය ඊට උදාහරණයකි. එහි කිසිදු පිළිගත හැකි මූලාශ්‍රයකින්ද තොරව සඳහන්ව ඇත්තේ 'ලොව පළමු වතාවට රුසියාව කොවිඩ්-19 ආසාදිත මළසිරුරක් පශ්චාත් මරණ පරීක්ෂණයට ගැඹුරින් යොමු කර, කොවිඩ්-19 යනු වෛරසයක් නොව විකිරණවලට නිරාවරණය වී රුධිරයේ කැටි ගැසීමෙන් මිනිස් මරණයට හේතු වන බැක්ටීරියාවක් බව' සොයාගත් බවයි!
කෙසේ නමුත් මෙම තොරතුරු සම්පූර්ණයෙන්ම අසත්‍ය බවට රොයිටර්, ඒපී නිව්ස් ඇතුළු පිළිගත් මාධ්‍ය මූලාශ්‍ර ගණනාවක් ඔස්සේම කරුණු ඉදිරිපත් වී තිබේ.
එසේ නම්, මව්බිම පුවත්පත මෙහිදී නිරවද්‍යතාවය සම්බන්ධ මාධ්‍ය ආචාර ධර්මයන් උල්ලංඝනය කර ඇත. මව්බිම විසින් ගත යුතු මීළඟ ආචාර ධාර්මික පියවර නම් ඒ පිළිබඳව නිවැරදි කිරීමක් පළ කිරීමයි. එය එසේ වනු ඇතිදැයි පාඨක අප බලා හිඳිමු.
මූලාශ්‍ර:
https://www.reuters.com/.../factcheck-russia-covid...
https://apnews.com/article/fact-checking-10056037732
#MediaEthicsSL #lka #SinhalaPress #mawbima #website